# වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම්

## வருடாந்த செயற்றிறன் அறிக்கை மற்றும் கணக்குகள்

# Annual Performance Report and Accounts

# 2015

**සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

**சுற்றுலா அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சு**

**Ministry of Tourism Development & Christian Religious Affairs**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම්

# 2015

**සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

6 වන මහල, රක්ෂණ මන්දිරය,නො:21,වෝක්ෂෝල් වීදිය,කොළඹ 02

මෙම වාර්තාව 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ අවශ්‍යතා සපුරාලිම පිණිස සකස් කරන ලදී.

# අන්තර්ගතය

පිටු අංකය


## පරිච්ඡේදය 1 - අමාත්‍යාංශයේ ව්‍යුහය

| | | |
|---|---|---|
| 1.1 | ආයතනික ව්‍යුහය | 1-3 |
| 1.2 | අමාත්‍යංශයේ අංශ | 4-6 |

## පරිච්ඡේදය 2 –වාර්ෂික කාර්ය සාධනය

අමත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්

| | | |
|---|---|---|
| **2.1** | ව්‍යාපෘතියේ නම: පළාත් මට්ටමින් සිදු කරනු ලබන සංචාරක සත්කාරක නිවාස වැඩපිළිවෙළ සඳහා ගම සංවර්ධනය කිරීම | 7-8 |
| **2.2** | ව්‍යාපෘතියේ නම: නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රජා පාදක සංචාරක සංවර්ධනය තුළින් දරිද්‍රතාවය තුරන් කිරීම (නියාමක ව්‍යාපෘතිය) | 8-9 |
| **2.3** | ව්‍යාපෘතියේ නම: නුවරඑළිය යෝජිත සංචාරක කලාපයේ සංචාරක ආකර්ශයන් වැඩි දියුණු කිරීම | 9-10 |
| **2.4** | ව්‍යාපෘතියේ නම : නුවරඑළියේ ඇති සංචාරක ස්ථාන වැඩි දියුණු කිරීම | 10 |
| **2.5** | ව්‍යාපෘතියේ නම: මහියංගනය සංචාරක පහසුකම් සැපයීමේ ස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම. | 10-11 |
| **2.6** | ව්‍යාපෘතියේ නම : සංචාරක කර්මාන්තයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සඳහා **Star Awards** වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 11 |
| **2.7** | ව්‍යාපෘතියේ නම : මුළු "පළාත් 9 සඳහා සංචරණය" පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම | 11 |

## පරිච්ඡේදය 3 –මූල්‍ය කාර්යසාධනය

| | | |
|---|---|---|
| **3.1** | පුනරාවර්තන හා මූලධන වියදම් | 12-14 |
| **3.2** | වැඩසටහන් සඳහා වන මූල්‍ය වියදම් | 14 |
| **3.3** | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම්"බී,ගිණුම | 15 |

## වගු


| වගු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 1.1 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල විස්තර | 1-2 |
| 2.1 | පලාත් අනුව පිහුටුවා ඇති සත්කාරක නිවාස පිළිබඳ විස්තර | 8 |
| 3.1 | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් | 12 |
| 3.2 | වැඩසටහන් අංක 01: මෙහෙයුම් ක්‍රියාකාරකම් | 12 |
| 3.3 | වැඩසටහන් අංක 02: සංවර්ධන ක්‍රියාකාරකම් | 13 |
| 3.4 | වැඩසටහන් අංක 01: මෙහෙයුම් ක්‍රියාකාරකම් | 13 |
| 3.5 | ව්‍යාපාති සඳහා වන මූලධන වියදම් | 13 |
| 3.6 | වැඩසටහන් අංක 02 : සංවර්ධන ක්‍රියාකාරකම් | 14 |
| 3.7 | වැඩසටහන් සඳහා වන මූල්‍ය වියදම් | 14 |
| 3.8 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්"බී" ගිණුම | 15 |

# දැක්ම

"ශ්‍රී ලංකාව ආසියාවේ බෙහෙවින්ම අගය කර සළකනු ලබන චාරිකා ගමනාන්තයක් බවට පත් කිරීම"

# මෙහෙවර

"ශ්‍රී ලංකාව තුල සහභාගිත්ව සංවර්ධනයක් ඇති කිරීම සඳහා දායක වෙමින් ඵලදායි හා තිරසාර බවෙන් යුත් සංචාරක ව්‍යාපාරයක් රට තුල සංවර්ධනය හා ප්‍රවර්ධනය කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම".

# අමාත්‍යාංශයේ කාර්යයන්

(2015.09.21 දිනැති අංක 1933/13 දරණ ගැසට් නිවේදනය අනුව)

- සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු විෂයන්ට අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම.
- සංචාරක නියෝජිතායතන ලියාපදිංචිය හා නියාමනය කිරීම.
- විවේකය ගත කිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීම
- සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති,වැඩසටහන්,සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
- අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතන හා දෙපාර්තමේන්තු වලට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයන්ට අදාළ කරුණු.
- අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතන අධීක්ෂණය

# අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතන

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
3. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය
4. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය
5. ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව.

# අමාත්‍යාංශයේ පරමාර්ථ

- ජාතික ආර්ථිකය වෙත ආදායම් උත්පාදනය උදෙසා සංචාරක කර්මාන්තය ශක්තිමත් කිරීම.
- ශ්‍රී ලංකාව වඩාත්ම යෝග්‍ය සංචාරක ගමනාන්තය බවට පත් කිරීම සඳහා සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් අතර අන්තර් සබඳතාවය හා සහයෝගිතාවය වැඩි දියුණු කිරීම
- දැනුම, නිපුණතාවය, නිර්මාණශීලීබව හා නව්‍යතාවයෙන් යුත් මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම .
- ක්‍රිස්තියානි / කතෝලික ප්‍රජාව අතර ආගමික වටිනාකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම .

# පරිච්ඡේදය 1

## අමාත්‍යාංශයේ ව්‍යුහය

**1.1** අමාත්‍යාංශයේ ආයතනික සැලැස්ම

**1.2** අමාත්‍යාංශයේ අංශ

# 1. අමාත්‍යාංශයේ ව්‍යුහය

## 1.1 අමාත්‍යාංශයේ ආයතනික සැලැස්ම

**හැඳින්වීම**

2015.09.21 දිනැති අංක: 1933/13 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත.

**අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව**

අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 70 ක් වන නමුත් මෙයින්, දැනට සිටින්නේ 50 ක පමණ සේවක සංඛ්‍යාවකි. විවිධ මට්ටම්වලින් තනතුරු 20 ක් පමණ පුරප්පාඩුව පවතී.

**අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලයේ සංයුතිය**

2015 වර්ෂයේදී, කළමනාකරණ සේවා අමාත්‍යාංශය විසින් සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ පහත සඳහන් තනතුරු අනුමත කර ඇත.

**සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව**

වගුව **1.1**


| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | වර්තමාන | පුරප්පාඩුව පවතින |
|---|---|---|---|
| ලේකම් | 1 | 1 | - |
| අතිරේක ලේකම් | 2 | 2 | - |
| අධ්‍යක්ෂ | 2 | 1 | 1 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | - | 1 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| සහකාර ලේකම් | 1 | 1 | - |
| සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) | 2 | 1 | 1 |
| සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 3 | 3 | - |
| අභ්‍යන්තර විගණක | 1 | - | 1 |
| පරිපාලන නිලධාරි | 1 | - | 1 |

| | | | |
|---|---|---|---|
| භාෂා පරිවර්තක | 2 | 1 | 1 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 1 | - | 1 |
| ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 | - |
| සංවර්ධන නිලධාරි | 15 | 10 | 5 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 12 | 10 | 2 |
| ගිණුම් සහකාර | 1 | 1 | - |
| ලඝු ලේඛක | 1 | 1 | - |
| නිශ්චල ඡායාරූප ශිල්පි | 1 | - | 1 |
| වීඩියෝ කැමරා ක්‍රියාකරු | 1 | - | 1 |
| රියදුරන් | 10 | 10 | - |
| සහකාර කැමරා ක්‍රියාකාරු | 1 | 1 | - |
| කාර්යාල කාර්ය සහයක | 9 | 7 | 2 |

**මූලය:** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානු ආගමික කටයුතු අමාත්‍යාංශය

**සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

**අමාත්‍යාංශ සංවිධාන ව්‍යුහය.**




කෙටි යෙදුම්: ස.ස- සංවර්ධන සහකාර, ස.නි- සංවර්ධන නිලධාරී, රා.ක.ස- රාජ්‍ය කළමණාකරන සහකාර, **කා.කා.ස** - කාර්යාල කාර්ය සහයක, **තො.තා.නි** -තොරතුරු තාක්ෂන නිලධාරී, **වී.කැ.ක්‍රි** -වීඩියෝ කැමරා ක්‍රියාකරු, **වී.කැ.ස** - වීඩියෝ කැමරා ක්‍රියාකරු සහයක, **ගී.ස** -ගිනුම් සහකාර, **සි/ඉ** -සිංහල/ඉංග්‍රීසි, : **ඉ/දෙ** ඉංග්‍රීසි/දෙමල.

# 1.2 අමාත්‍යාංශයේ අංශ

අමාත්‍යාංශයේ සමස්ත පරිපාලනය ප්‍රධාන අංශ 3 ක් යටතේ මෙහෙයවනු ලැබේ. එනම්, පරිපාලන, මානව සම්පත්, සංවර්ධන අංශය, සැළසුම් සහ සංවර්ධන අංශය හා මූල්‍ය අංශය වේ.

## 1.2.1 පරිපාලන හා මානව සම්පත් සංවර්ධන අංශය

මෙම අංශය අතිරේක ලේකම් (පරිපාලන,මූල්‍යය, සහ ක්‍රිස්තියානු ආගමික කටයුතු) යටතේ ක්‍රියාත්මක වේ.

පරිපාලන හා මානව සම්පත් අංශය,අමාත්‍යාංශය තුළ සේවක මණ්ඩල බඳවාගැනීම්,පත්කිරීම්, පුහුණුව, විනය ක්‍රියාමාර්ග සහ විශ්‍රාම ගැනීමේ ප්‍රතිලාභ සම්බන්ධව කටයුතු කරනු ලබන අතර මෙමගින්, ආයතනයේ කාර්ය මණ්ඩල ගැටලු පාලනය කරගෙන යනු ලබයි. එමෙන්ම, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සමඟ කටයුතු කිරීමේදී ඉහළ පෙළ කළමනාකරණය වෙත සහය දක්වයි. කාර්යමණ්ඩල හා පරිපාලන කටයුතුවලට සියළුම ක්‍රියාකාරකම් මෙන්ම පරිපාලන ප්‍රතිසංස්කරණ හා මහජන සබඳතා පිළිබඳ කටයුතු ද අන්තර්ගත වේ.

මෙම අංශවල, ප්‍රධාන කාර්යයන් වනුයේ,

- සේවක මණ්ඩලය බඳවා ගැනීම,පත්කිරීම,උසස්කිරීම හා විශ්‍රාම ගැනීම
- සේවක මණ්ඩලයේ දැනුම,කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම
- සේවක මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හා දිරිදීමනා ලබා දීම
- සේවක මණ්ඩල පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
- විනය කළමනාකරණය,
- දුක්ගැනිවිලි කළමනාකරණය,
- රාජ්‍ය ආයතන සමඟ සන්නිවේදන කළමනාකරණය
- අතිරේක සේවා හා ප්‍රසම්පාදනය
- ඵලදායිතාව වැඩිදියුණු කිරීම
- ඉ- රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

## 1.2.2 සැලසුම්, නියාමන හා සංවර්ධන අංශය

මෙම අංශය, අතිරේක ලේකම් (සංවර්ධන) යටතේ ක්‍රියාත්මක වේ. සංචාරක කේෂත්‍රයේ වර්ධනය හා සංවර්ධනය සඳහා මඟපෙන්වීමේදී හා නියාමනයේදී සැලසුම් හා සංවර්ධන අංශය ප්‍රධාන භූමිකාව ලෙස කටයුතු කරයි.මෙම අංශය, මඟින් නව සංවර්ධන විභවතාවල බලපෑම පිළිබඳ සැලකිලිමත්ව අධ්‍යයනය කරනු ලබන අතර,මෙහිදී ,උචිත වර්ධන ප්‍රතිපත්ති,සංචාරක සංවර්ධන හා පුළුල් ප්‍රජාවන් අන්තර්ගතවීම පිළිබඳ සැළසුම් ප්‍රවේශයක් භාවිතා කෙරේ.

රටෙහි සංචාරක වර්ධනය හා සංවර්ධනය උදෙසා මෙහෙයවනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද මෙම අංශයට අයත් වන අතර, ඒවා සැළසුම්,සමාලෝචන,පරීක්ෂා කිරීම්,ව්‍යවස්ථා බලගැන්වීම,ඉඩම් භාවිතය, සැළසුම් කිරීම,පරිසර විද්‍යාවන් සහ ඓතිහාසික සංරක්ෂණය අදාළ වේ.

සැළසුම් අංශය මඟින් සංචාරක අංශයට අදාළ සංවර්ධන යෝජනා සකස් කරනු ලැබේ.

**විස්තීරණ සැළසුම්කරණය:**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන සමඟව සමීපව කටයුතු කරමින් දිගු කාලීන සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා දායකත්වය සැළසීමටද මෙම අංශයට සිදුව තිබේ.

**වර්තමාන සැළසුම්කරණය:**

මෙම අංශය මඟින්,පළාත් සංචාරක ආයතන හා කාර්යාංශ සමඟ එක්ව නීතිගත කළ කෙටිකාලීන සංවර්ධන සැලැසුම් සකස් කෙරේ.

**සැළසුම් හා සංවර්ධන අංශය පහත සඳහන් කාර්යයන් සඳහා දායක වේ.**

- ශ්‍රී ලංකාවේ ගමනාන්තයක් ලෙස හඳුනාගත් සංචාරක ස්ථාන හා සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ව්‍යාපෘති විධිමත්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන,දෙපාර්තමේන්තු,සහ පළාත් සම්බන්ධීකරණය කිරීම
- සැළසුම් ක්‍රියාත්මක කිරීමේදී කාර්යසාධනය සමාලෝචනය කිරීම
- අදාළ ආයතනවල ප්‍රගතිය සකස්කිරීම හා වාර්තාකිරීම
- පාර්ලිමේන්තු කමිටු රැස්වීම් සඳහා වාර්තා සකස් කිරීම
- වාර්ෂික කාර්යසාධනය වාර්තා හා ගිණුම් සකස්කිරීම හා ප්‍රකාශයකට පත් කිරීම
- ව්‍යාපෘති කාර්යසාධනය ඇගයීම සම්බන්ධයෙන් ඇගයීම දරයි

### 1.2.3 මූල්‍යය හා ගිණුම්කරණ අංශය

මෙම අංශය ප්‍රධාන ගණාධිකාරී යටතේ ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශයේ, මූල්‍යය සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් මෙම අංශය වගකීම දරයි. මූල්‍ය අංශය මඟින් මූල්‍යය මෙහෙයුම් (මිලදී ගැනුම්,සැපයුම් ගෙවීම්,සේවක පඩි ලැයිස්තු වියදම් ගෙවීම්, සුළු මුදල්, ගිණුම්, ලැබීම්, මූල්‍යය පද්ධති, පුහුණුව )මූල්‍යය වාර්තාකරණය,මූල්‍යය සහය (පළාත් කණ්ඩායම්, මූල්‍යය පුහුණුව, මූල්‍යය රක්ෂණය හා සන්නිවේදන) හා වෘත්තීය සේවා (මිලදී ගැනුම්,භාණ්ඩාගාර,රක්ෂණ,බදු,හා විශ්‍රාම වැටුප්) ආදිය අන්තර්ගත සහයක සේවා ගණනාවක් සපයනු ලැබේ.

මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර,

- වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සකස්කිරීම
- විසර්ජන ගිණුම් සකස්කිරීම
- අයවැයගත වෙන්කිරීම අඛණ්ඩව නියාමනය කිරීම
- රාජ්‍ය නිළධාරින්ගේ අත්තිකාරම් “ බී” ගිණුම් සකස්කිරීම
- මූල්‍යය වාර්තා ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශයට අදාළ සියළු මූල්‍යය ක්‍රියාකාරකම් පාලනය කිරීම

# පරිච්ඡේදය 2

## වාර්ෂික කාර්ය සාධනය

### අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන කටයුතු

| | |
|---|---|
| 2.1 | ව්‍යාපෘතියේ නම: පළාත් මට්ටමින් සිදු කරනු ලබන සංචාරක සත්කාරක නිවාස වැඩපිළිවෙළ සඳහා ගම සංවර්ධනය කිරීම |
| 2.2 | ව්‍යාපෘතියේ නම: නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රජා පාදක සංචාරක සංවර්ධනය තුළින් දරිද්‍රතාවය තුරන් කිරීම (නියාමක ව්‍යාපෘතිය) |
| 2.3 | ව්‍යාපෘතියේ නම: නුවරඑළිය යෝජිත සංචාරක කලාපයේ සංචාරක ආකර්ශයන් වැඩි දියුණු කිරීම |
| 2.4 | ව්‍යාපෘතියේ නම : නුවරඑළියේ ඇති සංචාරක ස්ථාන වැඩි දියුණු කිරීම |
| 2.5 | ව්‍යාපෘතියේ නම: මහියංගනය සංචාරක පහසුකම් සැපයීමේ ස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම. |
| 2.6 | ව්‍යාපෘතියේ නම : සංචාරක කර්මාන්තයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සඳහා Star Awards වැඩසටහන ක්‍රියාත්මක කිරීම |
| 2.7 | ව්‍යාපෘතියේ නම : "පළාත් 9 සඳහා සංචරණය" පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම |

# 2. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්

## 2.1 ව්‍යාපෘතියේ නම : පළාත් මට්ටමින් සිදු කරනු ලබන සංචාරක සත්කාරක නිවාස වැඩපිළිවෙළ

සංචාරක සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ වගකීම දරන නිළධාරින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ බලයලත් නිළධාරීන් හා සබරගමුව විශ්ව විද්‍යාලයේ සම්පත්දායක පුද්ගලයන්ගේ සහභාගිත්වය ඇතිව " සංචාරක සත්කාරක නිවාස" වැඩපිළිවෙළ සඳහා උචිත තේමාවක් වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍යාශය මඟින් වැඩමුළුවක් සංවිධානය කර ඇත.

**පරමාර්ථ :**

- සංචාරක ක්ෂේත්‍රයට අදාළ රැකියා නිර්මාණය කිරීමෙන් හා සංචාරක ව්‍යාපාරය තුළින් ආර්ථික
  ප්‍රතිලාභ බෙදා හැරීමෙන් දේශීය ප්‍රජාව බල ගැන්වීම.
- ප්‍රජාවගේ ආර්ථික තත්තවය ඉහළ නැංවීම.
- සැබෑ දේශීය සංස්කෘතිය හා දේශීය ප්‍රජාවගේ ජීවන තත්තවය පිළිබඳ සංචාරකයින් හට ප්‍රත්‍යක්ෂ අත්දැකීමක් ලබා දීම.
- වර්තමානයේ පවතින සම්පත්වලින් අතිරේක ආදායමක් උපයා ගැනීම.
- දේශීය ප්‍රජාව සංචාරක අංශයේ කටයුතුවල නිරතවීම.

මුළු පළාත් නවයේ සංචාරක සත්කාරක නිවාස වැඩපිළිවෙළ වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් මූලෝපායන් ආරම්භ කර ඇත. එම පළාත්වල සංචාරක සත්කාරක ග්‍රාම 13 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි.21.00 ක් වෙන් කර ඇත.සංචාරක සත්කාරක ග්‍රාමයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.2015 ඔක්තෝබර් දක්වා වියදම රු.මි. 13.07 කි.

**පළාත් තුළ සිදු කරනු ලබන සංචාරක සත්කාරක නිවාස වැඩපිළිවෙළ:**

වගුව: **2.1**

| | පළාත | දිස්ත්‍රික්කය | ග්‍රාමය | වෙන්කිරීම රු.මි | වියදම රු.මි |
|---|---|---|---|---|---|
| **1** | බස්නාහිර * | කොළඹ | වල්ලියාවිට, මාදුරුවෙළ, | 3.00 | |
| **2** | මධ්‍යම | මහනුවර | හීල්ඔය | 3.00 | 2.00 |
| **3** | දකුණ | ගාල්ල | කන්නෙලිය | 3.00 | 0.65 |
| **4** | උතුර | යාපනය | වඩුක්කොඩායි | 3.00 | 0.98 |
| **5** | නැගෙනහිර | මඩකලපුව | කල්ලඩි, පාසි කුඩා | 3.00 | 2.00 |
| **6** | වයඹ | කුරුණෑගල | යාපහුව | 3.00 | 0.99 |
| **7** | උතුරුමැද | අනුරාධපුර | ඉසුරුමුනිගම | 3.00 | 2.01 |
| **8** | ඌව ** | බදුල්ල | ඇල්ල | 3.00 | |
| **9** | සබරගමුව | රත්නපුර | පදවිගම්පොළ,, සිලෝගම | 6.00 | 3.42 |

මූලාශ්‍රය: සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

* ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලදි.

** දක්වා නොමැත.

සංචාරක සත්කාරක ග්‍රාම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය,සංචාරක නවාතැන් පහසුකම් සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා අමාත්‍යාංශය විසින් ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද ආදර්ශ ව්‍යාපෘතියක් වූ අතර, එමඟින් ආදායම හා රැකියා අවස්ථා වැඩි කිරීමට දේශීය ප්‍රජාව වෙත උපකාරී වේ.

## 2.2 ව්‍යාපෘතියේ නම: නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රජා පාදක සංචාරක සංවර්ධනය තුළින් දරිද්‍රතාවය තුරන් කිරීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය සම්බන්ධ HC දර්ශකය ආසන්න වශයෙන් 3.3% බව වාර්තා වී ඇති බැවින්, මෙම දිස්ත්‍රික්කයේ සෑම පුද්ගලයන් තුන් දෙනෙක එක් අයෙකු දිළිඳු පුද්ගලයෙකු වේ. (දරිද්‍රතා දර්ශකය- කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය-2006/07- ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව). කුඩා හා මධ්‍යය පරිමාණ ව්‍යවසාය අංශයට සූක්ෂම ව්‍යවසායන් හා විශාල පරිමාණ සාමූහික ව්‍යවසායක අංශය සමඟ සම්බන්ධ වී ආර්ථික වාසි ලබා ගැනීමට හැකිවීමෙන්, එම අංශයේ විවිධ වූ ආර්ථික කටයුතු හරහා රැකියා අවස්ථා නිර්මාණය හා ධනය ව්‍යාප්ත වීම මඟින් සිදුවන සංචාරක සංවර්ධනය සඳහා ආර්ථිකයේ බහුගුණක සංකල්පයේ බලපෑම (multiplier effect) අමාත්‍යාංශය විසින් හඳුනා ගෙන ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.10 ක මුදලක් වෙන් කර ඇත.

**පරමාර්ථ:**

- ප්‍රජා සංචාරක අංශයට අදාළ ව්‍යාවසායකත්ව සංගම් සංවිධානය කිරීම හා ඔවුන්ගේ නිෂ්පාදනය හා ආදායම ඉහළ නැංවීමට සහය දැක්වීම.
- ප්‍රජාවන් සඳහා නව වෙළඳපළවල් වෙත ප්‍රවේශවීම සඳහා සහය වීම සහ සංචාරක අංශයේ සාමාජිකයන්හට සේවා නියුක්ත වීමේ හැකියාව ඉහළ නැංවීම.
- ග්‍රාමීය ආර්ථිකය හා බැඳි සංචාරක පාදක ක්‍රියාකාරකම්වලදී වටිනාකම් වෙනස්වීම (value change) වැඩිවීම ප්‍රවර්ධනය කිරීම.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක් හරහා නිර්දේශ කරන ලද අයදුම්කරුවන් 600 ක් අතරින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි.( අයදුම්කරුවන් 300 දෙනෙකු තෝරා ගන්නා ලදි.) ණය පහසුකම් සැපයීම සඳහා තෝරා ගනු ලබන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

**අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල:**

ආදායම වැඩිවීම තුළින් කුඩා පරිමාණ ව්‍යවසායයින් 200 ක් ප්‍රතිලාභ ලබයි.

## 2.3 ව්‍යාපෘතියේ නම: නුවරඑළිය දිස්ත්‍රික්කයේ යෝජිත සංචාරක කලාපයේ සංචාරක ආකර්ශයන් වැඩි දියුණු කිරීම

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ වලපනේ හා කොත්මලේ සංචාරක ආකර්ශනය සහිත ස්ථාන 10 ක් සංවර්ධනය සඳහා රු.මි. 10.00 ක මුදලක් වෙන් කර ඇත.

**පරමාර්ථ:**

- නව සංචාරක ස්ථාන 10 ක් සංවර්ධනය කිරීම.
- මෙම ප්‍රදේශය සඳහා ආයෝජන ගෙන ඒම.
- සංචාරක අංශයේ ප්‍රජා සහභාගිත්වය සඳහා සම්බන්ධවීමේ අවස්ථාව වැඩි කිරීම.
- ඍජු හා වක්‍ර රැකියා අවස්ථා නිර්මාණය කිරීම හා ඒ තුළින් ආර්ථික ප්‍රතිලාභ වැඩි වීම.

**අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල:**

- පවතින සංචාරක ප්‍රදේශ 5 ක වැඩි දියුණු කරන ලද යටිතල පහසුකම්.
- ප්‍රජාව සඳහා ආදායම් අවස්ථා 200 කට වඩා වැඩි ප්‍රමාණයක් ජනිත කිරීම.
- සංචාරක අංශය තුළ ගම්වාසීන්ගේ සහභාගිත්වය  වැඩි කිරීම.

## 2.4 ව්‍යාපෘතියේ නම: නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවතින සංචාරක ස්ථාන වැඩි දියුණු කිරීම

ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මි.20 ක මුදලක් වෙන් කර ඇත.

**පරමාර්ථ :**

- පවතින තෝරා ගත් ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය.
- ස්වකීය ස්ථානවල සිටින ජනතාව සඳහා ආදායම් අවස්ථා සැපයීම.

**අපේක්ෂිත නිමවුව් හා ප්‍රතිඵල:**

- පවතින සංචාරක ප්‍රදේශ 5 ක යටිතල පහසුකම් වැඩිදුයුණු කිරිම.
- ප්‍රජාව සඳහා රැකියා අවස්ථා 200 කට වැඩි ප්‍රමාණයක් උත්පාදනය කිරීම.
- සංචාරක අංශය සඳහා ග්‍රාමීය පුද්ගලයන්ගේ සහභාගීත්වය වැඩි කිරිම.

## 2.5 ව්‍යාපෘතියේ නම: මහියංගනය සංචාරක පහසුකම් සැපයීමේ ස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම

මහියංගනය සංචාරක පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු මි 15.00 ක මුදලක් වෙන් කර ඇත.

**පරමාර්ථ :**

- අදාළ සංචාරක ප්‍රදේශ වෙත ගමන් කරන සංචාරකයන් සඳහා පහසුකම් සැලසීම.
- පහසුකම් සපයන ස්ථානය තුළ නිෂ්පාදන අළෙවි කිරීම සඳහා අවස්ථා ලබා දීම.
- මධ්‍යම පළාතේ ප්‍රජා පාදක සංචරණය ප්‍රවර්ධනය කිරිම.

**අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල:**

- සෘජු හා වක්‍ර රැකියා අවස්ථා වැඩි වීම. (ආසන්න වශයෙන් ව්‍යවසායකයින් 100)
- ජීවන තත්වයේ ගුණාත්වය වැඩි වීම.

## 2.6 ව්‍යාපෘතියේ නම: සංචාරක ව්‍යාපාරයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය

සංචාරක කර්මාන්තයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා Star Awards වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු .මි 5 ක් වෙන් කර ඇත.

**පරමාර්ථ :**

- කුඩා හා මධ්‍ය පරිමාණ අංශයේ චාරිකා හා සත්කාරක කර්මාන්තයේ ව්‍යාපාරවල නිරතවන ව්‍යවසාකයින්/ කර්මාන්තකරුවන් දිරිමත් කිරීම
- ජාතික ආර්ථිකය වැඩි කිරීම සඳහා ඔවුන් විසින් සිදු කරන ලද සේවාවන් හඳුනා ගැනීම.

**අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල:**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ කර්මාන්ත 200 හඳුනාගෙන ඇත.

## 2.7 ව්‍යාපෘතියේ නම: මුළු "පළාත් 9 සඳහා සංචරණය" පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම

සියළුම පළාත් 9 සඳහා සංචාරක කර්මාන්තය පිලිබඳව සමුළුවක් පැවැත්වීම සඳහා රු. මි. 2.0 ක මුදලක් වෙන් කර ඇත.

**පරමාර්ථ:**

- සෘජුව හා වක්‍රව සේවා සපයන සියළුම කොටස්කරුවන් අනාගත සංචාරක සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම (රජයේ නිළධාරින්, පළාත් පාලන ආයතන හා විවිධ සේවා සපයන අනෙකුත් පුද්ගලයන්)
- සංචාරක සංවර්ධනය පිළිබඳව ශුභවාදී ආකල්ප සහිතව සිදුකරනු ලබන දැනුවත්කිරීම් (positive awareness)

# පරිච්ඡේදය 3

**මූල්‍ය ප්‍රගතිය**

**3.1** පුනරාවර්තන හා මූලධන වියදම්

**3.2** වැඩසටහන් සඳහා වන මූල්‍ය වියදම්

**3.3** රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුම

# 3.මූල්‍ය ප්‍රගතිය

## 3.1 අමාත්‍යාංශයේ පුනරාවර්තන හා මූලධන වියදම්

**වියදම් ශීර්ෂය -159**

පුනරාවර්තන හා මූලධන වියදම්

වගුව: 3.1

| විස්තරය | 2015 අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (රු.000) | 2015 ශුද්ධ වෙන් කිරීම (රු.000) | 2015 සත්‍ය වියදම (රු.000) | 2015 ඉතිරිය (රු.000) |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 56,500 | 56,000 | 43,331 | 12,669 |
| මූලධන වියදම් | 112,550 | 113,050 | 21,186 | 91,864 |
| **මුළු එකතුව** | **169,050** | **169,050** | **64,517** | **104,533** |

මූලාශ්‍රය: ගිණුම් අංශය,සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

වැඩසටහන් අංක 01 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

වගුව: 3.2

| විස්තරය | 2015 අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (රු.000) | 2015 ශුද්ධ වෙන් කිරීම (රු.000) | 2015 සත්‍ය වියදම (රු.000) | 2015 ඉතිරිය (රු.000) |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 56,500 | 56,000 | 43,331 | 12,669 |
| මූලධන වියදම් | 12,550 | 13,050 | 8,725 | 4,325 |
| **මුළු එකතුව** | **69,050** | **69,050** | **52,056** | **16,994** |

මූලාශ්‍රය: ගිණුම් අංශය,සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

වැඩසටහන් අංක 02 - සංවර්ධන ක්‍රියාකාරකම්

වගුව :3.3

| විස්තරය | 2015 අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (රු.000) | 2015 අනුමත ඇස්තමේන්තුව (රු.000) | 2015 සත්‍ය වියදම (රු.000) | 2015 ඉතිරිය (රු.000) |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | - | - | - | - |
| මූලධන වියදම් | 100,000 | 100,000 | 12,461 | 87,539 |
| **මුළු එකතුව** | **100,000** | **100,000** | **12,461** | **87,539** |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

## ශීර්ෂ අංකය - 159

**පුනරාවර්තන වියදම් - ව්‍යාපෘති අනුව**

## වැඩසටහන් අංකය - 01 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

වගුව: 3.4

| විස්තරය | 2015 අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (රු.000) | 2015 ශුද්ධ වෙන් කිරීම (රු.000) | 2015 සත්‍ය වියදම (රු.000) | 2015 ඉතිරිය (රු.000) |
|---|---|---|---|---|
| ව්‍යාපෘති අංක - 01 | 14,800 | 14,300 | 11,127 | ,173 |
| ව්‍යාපෘති අංක - 02 | 41,700 | 41,700 | 32,204 | 9,496 |
| **මුළු එකතුව** | **56,500** | **56,000** | **43,331** | **12,669** |

මූලාශ්‍රය: ගිණුම් අංශය,සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

**මූලධන වියදම් - ව්‍යාපෘති අනුව**

වගුව 3.5

| විස්තරය | 2015 අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (රු.000) | 2015 ශුද්ධ වෙන් කිරීම (රු.000) | 2015 සත්‍ය වියදම (රු.000) | 2015 ඉතිරිය (රු.000) |
|---|---|---|---|---|
| ව්‍යාපෘති අංක - 01 | 5,000 | 5,500 | 3,209 | 2,291 |
| ව්‍යාපෘති අංක - 02 | 7,550 | 7,550 | 5,516 | 2,034 |
| මුළු එකතුව | **12,550** | **13,050** | **8,725** | **4,325** |

මූලාශ්‍රය: ගිණුම් අංශය,සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

## වැඩසටහන් අංකය -02 සංවර්ධන ක්‍රියාකාරකම්

**මූලධන වියදම් - ව්‍යාපෘති අනුව**

වගුව **:3.6**

| විස්තරය | 2015 අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (රු.000) | 2015 ශුද්ධ වෙන් කිරීම (රු.000) | 2015 සත්‍ය වියදම (රු.000) | 2015 ඉතිරිය (රු.000) |
|---|---|---|---|---|
| ව්‍යාපෘති අංක - 03 - ආයෝජන | 100,000 | 100,000 | 12,461 | 87,539 |
| **උප එකතුව** | **100,000** | **100,000** | **12,461** | **87,539** |

මූලාශ්‍රය: ගිණුම් අංශය,සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

## 3.2 වැඩසටහන් සඳහා වන මූල්‍ය වියදම්

**මූල්‍ය ප්‍රභව**

වගුව: 3.8

| විස්තරය | 2015 අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම (රු.000) | 2015 ශුද්ධ ප්‍රතිපාදන (රු.000) | 2015 සත්‍ය වියදම (රු.000) | 2015 ඉතිරිය (රු.000) |
|---|---|---|---|---|
| දේශීය අරමුදල් | 169,050 | 169,050 | 64,517 | 104,533 |
| විදේශ ණය | - | - | - | - |
| විදේශ ප්‍රදාන | - | - | - | |
| ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | - | - | - | - |
| ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | - | - | - | - |
| ප්‍රතිපාර්ශවීය අරමුදල් | - | | - | - |
| විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය | - | - | - | - |
| විශේෂ නීති සේවා | - | - | - | - |
| එකතුව | 169,050 | 169,050 | 64,517 | 104,533 |

මූලාශ්‍රය: ගිණුම් අංශය,සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

3.3

## රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

**විෂය අංකය: 159011 , 159012**

වගුව: **3.8**

| විස්තරය | උපරිම හර සීමාව (රු.) | අවම බැර සීමාව (රු.) | හර ශේෂයේ උපරිම සීමාව (රු.) |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් | 3,000,000 | 20,000 | 18,000,000 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධිත සීමාවන් | - | - | - |
| | **වර්ෂය තුළ හර කිරීම්** | **වර්ෂය තුළ බැර කිරීම්** | **වර්ෂය අවසානයේ හර ශේෂය** |
| වර්ෂය තුළ තථ්‍ය අගයන්<br>1. 159011<br>2. 159012 | 1,671,715<br>5,189,390 | 1,106,106 | 565,609<br>5,189,390 |
| **එකතුව** | **6,861,105** | **1,106 ,106** | **5,754,999** |

මූලාශ්‍රය: ගිණුම් අංශය,සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය